HUMAN RIGHTS WATCH

# I. සාරාංශය

> මම කියන්නේ මේකයි, ත්‍රස්තවාදී කණ්ඩායමක් තිබෙනවනම්, අපිට ඒ' කණ්ඩායමට විරුද්ධව කිසිවක් කරන්න බැරි ඇයි? මේක ජනවර්ගයකට විරුද්ධව කෙරෙන දෙයක් නොවෙයි .... මම කථාකරන්නෙ ත්‍රස්තවාදීන් ගැන. එතෙන්දි ඕනෑම දෙයක් සාධාරණයි.
> - ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, 2007 ජුනි 12 වැනිදින

> මගෙ බිරිඳ අපේ කඳවුර ලග තිබුන ලිදේ නාමින් හිටිය. එකපාරටම ලොකු පුපුරණ සද්දෙයක් ඇහුන ඒ' එක්කම දූමක් ආව.... ඊට පස්සෙ මම දැක්ක එයා ලිඳ ලග වැටිල ඉන්නව.... හැමතැනම ලේ වැටිල තිබුන. මම එයාට කථාකළා ඒ'ත් එයා කථාකළේ නෑ.
> - 2006 නොවැම්බර් 08 වැනිදා කදිරවේලි අනාථ කඳවුරට හමුදාව එල්ලකළ ෂෙල් ප්‍රහාරයෙන් තම බිරිඳ අහිමිවූ දෙදරු පියෙක්

> අපිට ඕන එයා කොහේද ඉන්නෙ කියල දැනගන්න විතරයි. එයා සමහර වෙලාවට හිරගෙදර වෙන්න පුලුවන් ඒ'ත් කොහේද ඉන්නෙ කියල අපිට කියන්න.
> - "අතුරුදහන්වූ" පුතෙකුගෙ මවක්, 2007 මාර්තු මස, කොළඹදී

ශ්‍රී ලංකාව මානව හිමිකම් සම්බන්ධ අර්බුදයක වෙලී සිටී. රජය හා LTTE අතර අත්සන් තැබූ සාම ගිවිසුම වචනයට පමණක් සීමා වි ඇත. 2006 වසරේ මැද භාගයේ ප්‍රධාන හමුදා මෙහෙයුම් ආරම්භ කල දා සිට, සිවිල් වැසියන් බොහෝ පීඩාවලට මැදි වි ඇත. ඉන් සමහරේක් දෙපාර්ශවය අතර සටන් වලට මැදි විමෙන් ද, සීග්‍රයෙන් වැඩිවු පැහැර ගැනීම්, මරා දැමීම් හා අතුරුදහන් විම්ද හේතුවෙනි. යුද්ධය නැවත ආරම්භවීමත් සමගම මානව හිමිකම් සහ මානුෂික අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර නීතිය බරපතල අන්දමින් උල්ලංඝණය වීමේ සිදුවීම් වාර්තාවිය.

මෙම තත්වයට LTTE ය බොහෝදුරට වගකිව යුතුය. වෙනම නිදහස් දමිල රාජ්‍යයක් සඳහා සටන් කරන එම කණ්ඩායම සිවිල් වැසියන් කෙලින්ම ඉලක්ක කරමින් දුරස්ථ පාලක මගින් ක්‍රියාකරන බිම් බෝම්බ සහ මරාගෙන මැරෙන බොම්බ කරුවන් යොදා ගෙන ඇත. තවද විරුද්ධවාදි දෙශපාලකයින් මරා දැමීමද, බලහත්කාරයෙන් දමිල මිනිසුන් විශේෂයෙන් ළමයින් බඳවා ගැනීම්ද සිදුකරයි. උතුරු

නැගෙනහිර ප්‍රදේශයේ ඔවුන්ගේ (LTTE) පාලන ප්‍රදේශවල නිදහසේ අදහස් දැක්වීම, ඒකරාශිවීම හා සංචාරය LTTE ය දරුණු ලෙස වලක්වයි.

විශේෂයෙන්ම ඔවුන්ගේ සැලසුම් සහගත ලෙස ළමා සොල්දාදුවන් බඳවා ගැනීම් හා යුද්ධයට යොදා ගැනීම, දේශපාලන විරුද්ධවාදීන් මරා දැමීම් සහ විදේශයන්හිදි බලයෙන් ආධාර එකතු කිරීමේ උපක්‍රම ඇතුලු එල්ටීටීයේ මානව හිමිකම් උල්ලංඝණයන් Human Rights Watch සංවිධානය කලක් මුලුල්ලේම වාර්තා කර ඇත. අපි ඉදිරියේදීත් මේ ක්‍රියාවන් වාර්තා කිරීමටත්, එම ක්‍රියාමාර්ග වෙනස් කිරීමට LTTE ය යොමු කරගැනීමටත් ක්‍රියා කරමු.

එසේ නමුත් මෙම වාර්තාව මගින් මූලිකව අප යොමුවන්නේ ශ්‍රී ලංකා රජය මගින් හා එයට සම්බන්ධ හමුදා කණ්ඩායම් මගින් සිදුවන පසුගිය වසර තුලදී ඉතාමත් බරපතල ලෙස උග්‍රවු මානව හිමිකම් උල්ලංඝණයන් ගැනය. ගැටුම් උග්‍රවීමත් සමගම රජය ජාත්‍යන්තර නීතිය වෙත දැක්වූ සැලකිල්ල ඉතා අඩුවෙමින් උතුරු නැගෙනහිර ජනතාව වෙත සිදුවන අපහසුතා බොහෝවිට අඩුවෙන් ගනන් ගන්නා තත්වයකට යොමු වෙමින් පවති.

මෙම වාර්තාව පරිපූර්ණ වාර්තාවක් වීමට උත්සහ නොගනි. එමගින් විශේෂයෙන්ම උදාහරණ සහිතව පෙන්වා දීමට උත්සහ ගන්නේ අවධානයට යොමු විය යුතු මූලික අංගයන්ය. එනම් යුද්ධ නීතිය බිඳ දැමීම්, මරා දැමීම්, නෛතික රාමුවෙන් බාහිරව සිදුවන ජනමාධ්‍යය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිදහස සීමා කිරීම් සහ සුලභව සිදුවන රජයේ ආරක්‍ෂක හමුදාවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකිරීම් හෝ නොසලකා හැරීම්ය. ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවල සහ එයට සම්බන්ධ කණ්ඩායම්වල අත් අඩංගුවට ගැනීම්, " අතුරුදහන්කරවීම්", සාමාන්‍ය වැසියන්ට පහරදීම් සහ අනාථයන් බලහත්කාරයෙන් යලි පදිංචිකරවීම් පිලිබඳව ඇසින්දුටු සාක්ෂි සහකරුවන්ගෙ සහ අතවරයට ලක්වූවන්ගෙ සාක්ෂි මේ වාර්තාවට ඇතුලත්ය. මෙවැනි සිදුවීම් අධ්‍යයනය මගින් සිඝ්‍රයෙන් වැඩි වෙමින් පවතින ප්‍රකාශන නිදහස හා එකතුවීමේ නිදහසට රජයේ නොකැමැත්ත පෙන්නුම් කරයි. ප්‍රධාන වශයෙන් දමිළ ජාතිකයන් වුවද, සුළුතර මුස්ලිම් ජාතිකයන් හා බහුතර සිංහල ජාතිකයන්ද රජයේ මෙම මානුෂික අයිතීන් උලල්ංඝනය විම්වලට බඳුන් වි ඇත.

ශ්‍රී ලංකාවේ ආරක්‍ෂක අංශය මේ උල්ලංගනය විම් වලට ප්‍රධාන වශයෙන් වග කිව යුතුය. ජනවාර්ගික අර්බුදයට ප්‍රතිපත්තිමය වශයෙන් ආරක්‍ෂක අංශය සම්බන්ධවී සිටින්නේ මහින්ද රාජපක්‍ෂ ජනාධිපති තුමා පත්විමත් සමග ඔහුගේ සොයුරු

ගොඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් තනතුරට පත්විමත් සමගය. ඔහු (ආරක්ෂක ලේකම්) මරා දැමීමට LTTE ය ගත් උත්සාහයෙන් පසුව රජය මගින් ආරක්ෂක හමුදාවන්ට අති ප්‍රබල ලෙස අත්අඩංගුවට ගැනීම් හා රඳවා ගැනීමේ බලතල ලබා දෙන හදිසි නීති විධි විධානයන් තර කරන ලදී. එසේම මානුෂික හිමිකම් සම්බන්ධව හෝ රාජ්‍ය දූෂණ සම්බන්ධව හෝ රජය LTTE සමඟ ගැටුමේදි ක්‍රියාකරන ආකාරය විවේචනය කරන මාධ්‍යවේදීන්ට එරෙහිව මෙම ත්‍රස්ත විරෝධි බලතල යොදා ගෙන ඇත.

රජයේම ඉහල නිලධාරීන්ද මේ සම්බන්ධව තම ප්‍රබල අවධානය පලකොට තිබේ. එවකට රජයේ විදේශ ඇමතිව සිටි මංගල සමරවීර දෙසැම්බර් 13, 2006 දිනැති පුද්ගලික ලිපියක් ජනාධිපති රාජපක්ෂ මහතා වෙත යවමින් රජය මීට වඩා මානුෂික අයිතිවාසිකම් බිඳ වැටීම් වැලැක්වීමට ක්‍රියා කල යුතු බව දන්වා ඇත. මෙම ලිපිය ඔහු එම තනතුරින් ඉවත් කලාට පසුව මාධ්‍යයන්ට වාර්තා විය. එම ලිපියේදි මංගල සමරවීර කියන පරිදි "නිතර වාර්තා වන පැහැර ගැනීම් හා මරා දැමීම් සම්බන්ධ සිද්ධින් රජයට, රජයට හිතවත් කරුණා පාර්ශවයට හෝ LTTE යට විරුද්ධ වුවද, රජයේ ප්‍රදේශ වලදි හෝ LTTE පාලන ප්‍රදේශ තුල වුවද, එම ක්‍රියාවන් රජය මගින් හෝ ත්‍රස්ත කණ්ඩායම් මගින් සිදු කලද, ඒවා ගැන සොයා බලා වැරදි කල අයට නීතියෙන් දඬුවම් ලබාදීම අප අත්සන් කල ජාත්‍යන්තර ගිවිසුම් වලට අනූව රජයේ වගකීමකි." "LTTE ය වැනි කෲරතර ත්‍රස්ත කණ්ඩායමක් සමග කරන සටනේදි පවා රජය ඔවුන් හා සමාන පහත් උපක්‍රම යොදා ගන්නා බවට දැක්විය යුතු නැත. රජය හා එහි සියළුම පාර්ශවකරුවන් විසින් නීතියට ගරු කල යුතු" බව එම ලිපියෙ සඳහන්වේ.

මේ සිදුවන මානව හිමිකම් කඩවීම් වර්ධනය, වරක් මානව හිමිකම් සුරැකීමට මූලික වු ජනාධිපති රාජපක්ෂ රජයක් යටතේ සිදුවීම පුදුමයකි. 1990 දී, සිදුවූ අතුරුදන්වීම් සම්බන්ධව විස්තර, එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමිසමට ගෙන යෑමට එකල ඔහු මුලික විය. ජනාධිපති රාජපක්ෂගේ නිල චරිතා ප්‍රදානයේදි ඔහු මානව හිමිකම් සුරැකීමේ ප්‍රධානියෙකු ලෙස සඳහන් වුවද ඔහුගේ පාලන කාලය තුල එම ලක්ෂණ පෙන්විමට ඔහු අපොහොසත් වි ඇත.

## ගැටුම්වලදී සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන්

සාමාන්‍ය ජනයා මිය යෑම, අවතැන් වීම් වැනි ජාත්‍යන්තර නීතිය කඩවීම් බොහෝමයක් සිදු වි ඇත්තේ අවි ගැටුම් වලදීය. රජය LTTE යන දෙපාර්ශවයම ගැටුම්වලදී ගැටුමට සම්බන්ධ නැති පාර්ශවයන්ට වන හිරිහැර ගැන කිසිම සැලකිල්ලක් දක්වා නැත.

මෑත අවුරුදු වලදි සිදුවූ එවැනි දරුණු සිද්ධියක් ලෙස 2006 නොවැම්බර් 8 දින නැගෙනහිර පලාතේ වාකරෙයි හිදි වූ සිදුවීම සැලකිය හැක. එහිදි රජයේ හමුදා මගින් කල ෂෙල් ප්‍රහාරයකදි එය අවතැන් වූවන් සිටි පාසැල් කඳවුරකට එල්ලවීමෙන් පුද්ගලයින් 62 දෙනෙක් මරණයට පත්වි, 47 දෙනෙක් තුවාල විය. රජයේ හමුදා සටන් කාමීන් හා සාමාන්‍යය ජනයා වෙන් කර ගැනීමට අසමත්වූ අතර ඔනෑකමින්ම එම කඳවුර ඉලක්ක කර ගත්තා විය හැක. Human Rights Watch සංවිධානයට ඇසින් දුටු සාක්ෂිකරුවන් පැවසූ අන්දමට රජය ප්‍රකාශ කල පරිදි LTTE ය එම කඳවුර භූමියේ සිට මුලින් ප්‍රහාර එල්ල කල බවට හෝ ඔවුන්ව මානූෂික පලිහක් ලෙස යොදාගෙන ප්‍රහාර කළ බවට හො සාක්ෂි ලැබී නැත.

රටතුල අවතැන්වූ අයගේ කාරණය ඉතා සුවිශේෂීය. 2000 අගෝස්තු මාසයේ සිට ගැටුම් නිසා 315,000ක් පමණ පිරිසක් ඔවුන්ගේ වාසස්ථාන වලින් ඉවත් වී ඇත. එයින් 100,000ක පමණ පිරිසක් අවතැන්විම සිදුවූයේ 2007 මාර්තු මාසයේදීය. මේ පිරිසට අමතරව තවත් 200,000 - 250,000 පමණ පිරිසක් 2004 සුනාමි ව්‍යවසනයේදි අවතැන්ව සිටියහ. මේ බොහොමයක්ම අය මෑතදී ගැටුම් සිදුවූ ප්‍රදේශවල පදිංචි කරුවන්ය. තවද ඊටත් කලින් (2002ට පෙර) තවත් 315,000 පමණ පිරිසක් යුධ ගැටුම් හේතුවෙන් අවතැන්ව සිටියහ. 2006 ජනවාරි සිට 18,000 ට වඩා වැඩි පිරිසක් ඉන්දියාවට අනාතයන් ලෙස පැන ගොස් ඇත. බෝහෝවිට මොවුන් ගමන් කර ඇත්තේ අනතුරු දායක කුඩා බෝට්ටු මගිනි.

දෙපාර්ශවයම (රජය හා LTTE ය) මේ අවතැන්වූවන් ගේ අවශ්‍යතා පරිපූර්ණ ලෙස ඉටුකිරීමට අසමත් වි ඇත. එසේම රජය ඉලක්කයක් නොමැතිව කරන ෂෙල් ප්‍රහාර මගින් හා මානුෂික ආධාර වැලැක්වීම් මගින් සමාන්‍ය ජනයාට පලායාමට කටයුතු කර ඇත. තවද රජය ආරක්‍ෂාව සහතික කල බව කියන නමුත් නියමිත ආරක්‍ෂාවක් හෝ මානූෂික පහසුකම් නොමැතිව අවතැන්වූවන් බලහත්කාරයෙන් නැවත පදිංචි කර ඇත.

ගැටුම්වලට මැදිවී සිටින සාමාන්‍ය ජනතාවට සහන සැලසීම දේශීය සහ ජාත්‍යන්තර ආධාර ආයතනවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට දිනෙන් දිනම දුෂ්කර වෙමින් වෙමින් පවතින අතර, ඔවුන් ඇතැම්විට ප්‍රහාරවලටද ලක්වී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, ආධාර ආයතනවලට සම්බන්ධ 24 දෙනෙක් ශ්‍රී ලංකාව තුළදී 2006 වසරේදි මරණයට පත්ව ඇත. ඒ අතර අගෝස්තු මාසයේදී මරා දමන ලද පැරිසිය මූලස්ථාන කරගත් Action Contre Le Faim හි දේශීය සේවකයන් 17 දෙනාද වෙයි.

## පැහැරගැනීම් හා අතුරුදන්වීම්

පැහැරගැනීම් හා සිදුකරන ලද අතුරුදහන්වීම් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවෙමින් ඇත. ජාතික මානව හිමිකම් කොමිසමට අනුව එවැනි සිදුවීම් 1000 ක් 2006 දීද තවත් එවැනි සිදුවීම් 100 ක් 2007 මුල්මාස දෙක තුළද වාර්තා වී ඇත. රජය මගින් එවැනි අතුරුදහන් වීම් ගැන සොයා බැලීමට 2006 සැප්තැම්බර් පත්කල කොමිසම 2007 ජූනිවලදි කියා සිටියේ 2006 සැප්තැම්බර් 14 සහ 2007 පෙබරවාරි 25 අතරදි පුද්ගලයින් 2020 ක් පමණ අතුරුදහන්වී හෝ පැහැරගැනීමට ලක්වී ඇති බවයි. දළ වශයෙන් මෙයින් 1134 පමණක් ජීවතුන් අතර සිටින බව සොයාගත් අතර අනෙක් අය තවමත් සොයාගත නොහැකි වී ඇත.

රජයේ හමුදා පාලනයේ පවතින යාපන අර්ධද්වීපයේ පමණක් 800 කට වඩා වැඩි ගණනක් 2005 දෙසැම්බර් හා 2007 අප්‍රේල් අතරදී අතුරුදහන්ව ඇති බව වාර්තා වේ. අතුරුදන්වීම් ගැන සොයා බලන විශ්වාසදායි රාජ්‍ය නොවන සංවිධානයකට අනුව මේ අයගෙන් 564 දෙනෙක් තවමත් (මැයි 1 වනවිට) අතුරුදන්වී ඇත.

LTTE ය කාලයක් තිස්සේම පැහැරගැනීම් වලට වගකිවයුතු වුවත්, මෑතදී සිදුවූ එවැනි සිද්ධීන් බොහොමයක් රජයේ හමුදා හෝ රජයට සම්බන්ධ සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියා බව පෙනී යයි.

"අතුරුදහන්වූ" අයගෙන් බහුතරයක් ඝාතනයට ලක්වී තිබිය හැකි අතර, තවත් සමහරුන් හිදිසි නීති රෙගුලාසි යටතේ රඳවාගෙන සිටිනවා වියහැක. එසේ නම් රජය එවැනි අයගේ නම් ගම්

ඔවුන්ට එරෙහි චෝදනා හා රදවා තබා ගන්නා ස්ථානය ප්‍රසිද්ධ කල යුතුය. එවැනි චෝදනා නොමැති අය නිදහස් කල යුතුය.

Human Rights Watch සංවිධානය 2006 දී එසේ අතුරුදහන්වූ බවට සඳහන් අයගේ ඥාතීන් 109 දෙනෙකු හමුවී සාකච්ඡා කලේය. ඒ අතරට යාපනය, වවුනියාව, ත්‍රිකුණාමලය, සහ මඩකලපුව හි වැසියන් අයත් විය. මෙවැනී සිද්ධීන් ප්‍රධාන වශයෙන් වර්ග 2 කට වෙන්කල හැකිය: එනම් රජය මගින් ත්‍රස්තවාදය මර්ධනය නාමයෙන් සිදු කරන උල්ලංඝනයන් හා රජයට සම්බන්ධ අතුරු සන්නද්ධ හමුදා කණ්ඩායම් හා LTTE මගින් සිදු කරන විරුද්වාදීන්ට එරෙහි සිද්ධීන් සෙබලුන් බඳවා ගැනීම් හෝ බලහත්කාරයෙන් මුදල් එකතු කිරීම් වේ.

පසුගිය වසර 2 තුළ නීතියේ බිඳවැටීමත් සමඟම සමහර අපරාධ කණ්ඩායම් ද සමහර පැහැරගැනීම් වලට සම්බන්ධ බව පෙනී යයි. 2006 අගදී හා 2007 දී සිදුවූ බොහෝ පැහැරගැනීම් වලට සුළුතර දමිල ජාතික ව්‍යාපාරිකයින් බදුන් වූ අතර කප්පම් ඉල්ලීම්ද සම්බන්ධ විය. 2002 මැයි – ජුනි කාලයේදී (නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කයේහි ජීවත්වන) මුස්ලිම් ජාතිකයන්ද, ඉලක්ක විය.

වර්ධනය වන දේශීය හා ජත්‍යාන්තර බලපෑම් නිසා, රජය පැහැරගැනීම් හා අතුරුදහන් කිරීම් සම්බන්ධව යම් පියවර ගෙන ඇත. ඒ අනුව සමහර චූදිතයන් කිහිපදෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත. නමුත් මේ පියවර මගින් නීති විරෝධි ක්‍රියාවල විශාල අඩුවක් නොපෙනේ. 2006 සැප්තැම්බරයේදී ආණ්ඩුව විසින් පත්කරන ලද "අතුරුදහන්වීම්" පිලිබඳ ඒක පුද්ගල කොමිසම මානව හිමිකම් උල්ලංඝනයන් සහ එයට එරෙහිව ක්‍රියාකිරීමට ආණ්ඩුවේ ඇති නොහැකියාව පිලිබඳව බරපතල නිවේදන නිකුත්කොට ඇතත්, ආණ්ඩුව කොමිසමේ කිසිදු වාර්තාවක් ප්‍රකාශයට පත්කොට නොමැති අතර, කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද ආණ්ඩුව බැඳී නොසිටී.

එවැනි ක්‍රියාවලට රජයේ ඇති සම්බන්ධය ඔප්පු කරන පැහැදිලි සාක්ෂි පදනමක් නැති ලෙස ප්‍රතික්ෂේප කරන ආණ්ඩුවේ ප්‍රකාශකයෝ රජයේ හමුදාවලට එවැනි චෝදනා කරනවුන් LTTE යට උදව්කරන අය වශයෙන් පෙන්නුම් කරයි. වරක් අතුරුදන්වූවන් වෙනුවෙන් පෙනීසිටි

ජනාධිපති රජපක්ෂම එවැනි අතුරුදහන්වීම් පිලිබඳ බොහෝ සිදුවීම් සත්‍යයෙන් තොර බවට බැහැරකොට ඇත. "පැහැරගත්තයි කියන බොහෝ දෙනා පිටරට ගිහිල්ල ,එගොල්ලො දැන් එංගලන්තයේ නැත්නම් ජර්මනියෙ" යැයි 2007 මැයි වලදී ඔහු ප්‍රකාශ කලේය. “ඔවුන් පැහැරගත් බවට පැමිණිලි කලද නැවත පැමිණි බව කියා සිටින්නේ නැත” යයි ඔහු කියා සිටියේය.

## අත්අඩංගුවට ගැනීම් හා රඳවාගැනීම්

2005 අගෝස්තු මාසයේදී විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් අනතුරුව, එවකට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග රජය 2000 හදිසි නීති රෙගුලාසි මත පදනම්ව හදිසි නීති විධි විධාන පැනවිය. ශ්‍රී ලංකාවේ කලක් මුලුල්ලේම මතභේදයට තුඩුදී තිබෙන කරුණක් වන හදිසි නීතිය මගින් අත් අඩංගුවට ගැනීම සහ රඳවාගැනීම සඳහා ආරක්ෂක හමුදාවලට පුලුල් බලතල ලබාදී ඇති අතර, අනුමාන කරන ලද චෝදනා මත පුද්ගලයෙකු මාස 12ක් දක්වා කාලයක් නඩු පැවරීමෙන් තොරව රඳවාගැනීමටද බළධාරීන්ට එමගින් අවසර ලැබේ.

පසුගිය 18 මාසය තුළ රාජපක්ෂ රජය එලෙස සිය ගණනක් පුද්ගලයින් මෙම රෙගුලාසි මත රඳවාගෙන ඇත. මුලික ඉලක්කය වන්නේ LTTE යට සහාය දෙන හෝ ඒ බවට සැකකරන දමිල තරුණයන් වන අතර, මෑතකදී දමිල නොවන LTTE යට සහාය දෙන බවට සැක කරන අනෙක් ජාතිකයන්ද අත්අඩංගුවට ගෙන තිබේ.

පුලුල් වු හා නිශ්චිත ලෙසම අර්ථ දක්වා නැති මෙම නීති පද්ධතිය මගින් ජාතික ආරක්ෂාවට ඕනෑම ආකාරයකින් හානිකර ඕනෑම කටයුත්තක යෙදෙන ඕනෑම කෙනෙක් හෝ නීතිය හා සාමය කඩකරන ඕනෑම කෙනෙක් හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීමට බාධාකරන ඕනෑම කෙනෙක් රඳවාගැනීමට ඉඩ සලසා දී ඇත. බලධාරින්ට සිතාසි නොමැතිව මේ රෙගුලාසි මත ඕනෑම කෙනෙක් ගැන සොයා බැලීමටත්, සොයා බැලීම සඳහා රඳවා ගැනීමටත් සේම ඕනෑම අයෙක්  අත්අඩංගුවට ගැනීමටත් හැකිය.

මේ රෙගුලාසි මගින් කෙනෙක් නිවාස අඩස්සියේ තැබීමටත් යම් කෙනෙකුගේ හෝ කණ්ඩායමක ගමන්බිමන් සීමා කිරීමටක්, යමෙක් රටින් පිටවීම තහනම් කිරීමටත්, කෙනෙකුගේ

ව්‍යාපාරික හෝ රැකියා කටයුතු සීමා කිරීමටත් බලය ලැබේ. එමගින් 'සංවේදි' බවට පුලුල්ව වර්ග කර යම් ලිපියක් පලකිරීම වැළැක්වීමටත් පොදු රැස්වීම් ආදිය තහනම් කිරීම හෝ බාදා කිරිමත් කල හැකිය.

හදිසී නීතිය යටතේ අත්අඩංගුවට ගත් අයගේ ගනන නිශ්චිත නැත. 2007 මාර්ගවලදී පුද්ගලයින් 452 (දෙමළ - 372, සිංහල– 6ල මුස්ලිම් – 19) එම නීතිය යටතේ අත්අඩංගුවේ සිටින බව රජය ප්‍රකාශ කලේය. ඒ අතර ආරක්ෂක හමුදා සෙබලුන් 15 ක් පොලිසියේ 5 ක්, එක් හිටපු පොලිස් නිලධාරියෙක් සහ ආරක්ෂක හමුදාවලින් පැනගිය 8 දෙනෙක්ද විය. ජුනි මාසයේ Human Rights Watch සංවිධානය මගින් අලුත් සංඛ්‍යාවන්, ඔවුන්ගේ චෝදනා පත්‍ර වල තත්වය සහ ඔවුන් රඳවා සිටින ස්ථාන පිලිබඳ විස්තර ඉල්ලා සිටියත් රජය එම තොරතුරු සැපයීමට අපොහොසත් විය.

"ත්‍රස්තවාදය සහ අර්ථ දක්වන ලද ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වැලැක්වීමේ සහ තහනම් කිරීමේ" තවත් හදිසි අවස්ථා රෙගුලාසියක් 2006 දෙසැම්බරයේදී ආණ්ඩුව විසින් පණවන ලදි. ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර නීතිය යටතේ ආරක්ෂාකොට තිබෙන සාමකාමී ක්‍රියාකාරකම් ගණනාවක් අපරාධ ලෙස වර්ගකිරීමට මෙම නීතියේ පුලුල් අර්ථ දැක්වීම මගින් අවස්ථාව සැලසේ. මානව හිමිකම්, ජනවර්ග අතර සම්බන්ධතා හෝ සාමය ගොඩනැගීම සඳහා ක්‍රියාකරන ආයතන ඇතුලු ජනමාධ්‍ය සහ සිවිල් සමාජ සංවිධාන දඩයම් කිරීම සාධාරණීකරණය කිරීමට ඇතැම් රෙගුලාසි යොදාගත හැකිය. එසේම එහි ඇති පුළුල් වගකීමෙන් ආරක්ෂා කිරීමේ වගන්ති මගින් ආරක්ෂක හමුදා සාමාජිකයන් නීතය හමුවට ගෙන එම හොඳ අරමුණින් කටයුතු කල බව පෙන්වමින් මගහැරිය හැක.

<u>කරුණා කණ්ඩායමේ උල්ලංඝනයන්</u>

ශ්‍රී ලංකා රජය වි. මුරදලිදරන්ගේ නායකත්වයෙන් යුත් 2004 දි LTTE යෙන් වෙන්වූ දැනට රජය සමඟ LTTE යට විරුද්ධව සහයෝගයෙන් සටන් කරන කරුණා කන්ඩායමේ නීති විරෝධි ක්‍රියා වලට විරුද්ධව පියවර ගැනිමට අසමත්ව ඇත. LTTE යට නැගෙනහිර ප්‍රදේශයන් නැතිවිමත් සමගම කරුණා කණ්ඩායම තමන්ගේ පාලනය අම්පාර, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික් වලට පුලුල් කර ඇත. තවද ඔවුන්ගේ කටයුතු, කොල්ලකෑම් හා පැහැරගැනිම් ආදිය වවුනියා දිස්ත්‍රික්කයේ උතුරු පෙදෙසෙහි වර්ධනය වි ඇත.

එක්සත් ජාතින්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යාන්තර සංවිධානවල නිර්දේශ හා විවේචන මධ්‍යයේ වුවද කරුණා කන්ඩායම රජයේද සහයෝගය ඇතිව තරුණයින් හා ළමයින් බලහත්කාරයෙන් දිගටම යුද්ධයට බඳවා ගනිමින් තිබේ. UNICEF සංවිධානය විසින් 2006 දෙසැම්බර් හා 2007 ජුනි අතර කාලය තුල කරුණා කණ්ඩායම් සිදුකල එවැනි ළමා බඳවාගැනීම් හෝ නැවත බඳවාගැනීම් 14 ක් වාර්ථා ගතකර ඇත. නියම සංඛ්‍යාව බොහෝ වැඩිවිය හැක්කේ මෙවැනි සද්ධීන් වාර්ථා කිරීමට බොහෝ දෙමාපියන් බියක් දක්වන බැවිනි. තවද මෙම සංඛ්‍යාවට අවුරුදු 18 ට වැඩි තරුණයින් බලයෙන් කැඳවා ගැනීමේ සිද්ධීන් ඇතුලත් නොවේ.

2007 පෙබරවාරි වලදී Human Rights Watch සංවිධානයට කරුණා කණ්ඩායමේ අවිගත් ළමා සොල්දාදුවන් ඔවුන්ගේ දේශපාලන කාර්යාල වල ආරක්ෂාවට සිටින ආකාරය (රජයේ පොලිසිය හා හමුදාවලට පෙනි පෙනි ) දැකගත හැකිවිය. නැගෙනහිර පලාතේ කරුණා කණ්ඩායමේ නායකයෙක් හමුදාවේ මාර්ග ප්‍රවාහන වාහනයක ගමන් කරනුද දැකගත හැකිවිය. අවිගත් කරුණා සාමජිකයින් මඩකලපුව දිස්ත්‍රික්කයේ පාරවල් වල හමුදා පරිස් වලට පෙනි පෙනි නිදහසේ ගමන් කරනුද සමහරවිට එකට පොලීසීය සමඟම මුර සංචාරයේ යෙදෙනුද දැකගත හැකිවිය.

ජනාධිපති රාජපක්ෂ හා අනෙක් රාජ්‍ය නිලධාරින් නැවත නැවතත් කරුණා කණ්ඩායටම සහය දක්වමින් නීතිය කඩන එවැනි ආරක්ෂක හමුදා සමාජිකයින් ගැන පරික්ෂන කර දඩුවම් දෙන බවට පොරොන්දු වී ඇත. නමුත් අද වනතුරු රජය එවැනි සුදුසු පියවරක් ගෙන නැත. ' ආරක්ෂක හමුදාවල කිසිම සාමාජිකයෙක් එවැනි වරදකට දඩුවම් කිරීමකට හෝ නීතිය හමුවට පැනවූ බවට දැනගන්නට නැත.

දැනට පැහැදිලි ලෙසම ආරක්ෂක හමුදාව තරුණ කණ්ඩායම් පැහැරගැනීම් මරාදැම්මී හා කප්පම් ගැනීම් වල සහයෝගය ලබාදෙන රටාවක් පෙනේ.

Human Rights Watch සංවිධානය ජනාධිපති රාජපක්ෂ විසින් ප්‍රකාශයට පත්කල පරික්ෂණයහි තත්වය ගැන විමසුවේය. කිසිම වාර්තාවක් එලිදැක්වීමට පෙරම රජය විසින් ඔවුන් තරුණ

කණ්ඩායම සමග ලමා සෙල්දාදුවන් බඳවා ගැනීමේ හෝ පැහැරගැනීම් වල සම්බන්ධව නැති බවට ප්‍රකාශ කලේය. මෙමගින් අවංක පරීක්‍ෂනයක් කිරීමේ රජයේ උවමනාව සැකයට තුඩුදෙයි.

## විරුද්ධ මතධාරීන් මර්ධනය කිරීම

මානව හිමිකම් හෝ සන්නද්ධ ගැටුම පිලිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ප්‍රශ්ණකරන්නන් හෝ විවේචනය කරන්නන් නිහඬකිරීමට ගන්නා උත්සාහයන් ආණ්ඩුව විසින් උත්සන්න කොට ඇත. "ද්‍රෝහීන්, ත්‍රස්තවාදයට අනුබල දෙන්නන් සහ එල්ටීටීඊ ආධාරකරුවන්" ලෙසින් හඳුන්වමින් ආණ්ඩුව සාමකාමී විවේචකයන් බැහැරකරයි. සිද්ධීන් සම්බන්ධයෙන් ආණ්ඩුවේ මතයට නොගැලපෙන මත පළකරන්නන්ට එරෙහිව පියවර ගැනීම සඳහා ආණ්ඩුව විසින් ත්‍රස්ත මර්ධන නීති යොදාගෙන ඇත.

ලාංකීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂික ආධාර සංවිධානවලට එල්ලවෙන බලපෑම් උත්සන්නවෙමින් පවතී. මානව හිමිකම් උල්ලංඝණයන් පිලිබඳව ඔවුන් එල්ලකරන චෝදනා "පදනම් විරහිත" බව පවසමින් බැහැරකරන ආණ්ඩුව එල්ටීටීඊ සංවිධානයේ ප්‍රචාරක ව්‍යාපාර මගින් ඔවුන්ට බලපෑම් එල්ලවී ඇති බවටද ප්‍රති චෝදනා නගයි. "කිසිදු පූර්ව විමර්ෂණයකින් හෝ සොයාබැලීමකින් තොරව එල්ටීටීඊයේ ප්‍රචාරක ව්‍යාපාරවලට ගොදුරුවන ඕනෑම කණ්ඩායමකට හෝ සංවිධානයකට එල්ටීටීඊයේ ප්‍රචාරක කටයුතුවලට සහාය දෙන බවට චෝදනා එල්ලවිය හැකිය," යනුවෙන් ආණ්ඩුවේ සාම ලේකම් කාර්යාලය 2007 මාර්තු මාසයේදී ප්‍රකාශ කළේය.

"එල්ටීටීඊ සංවිධානයට සහායදීම" අපරාධයක් බව සඳහන්වන ශ්‍රී ලංකාවේ හදිසි නීති රෙගුලාසිවලට අනුව, මෙසේ මානවහිමිකම් සංවිධාන පොදුවේ එල්ටීටීඊයට සම්බන්ධ කිරීමට දැරෙන උත්සාහය එල්ටීටීය දැඩිව විවේචනය කරන කණ්ඩායම් ඇතුලු මානව හිමිකම් සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු වාර්තාකිරීමට ක්‍රියාකරන සංවිධාන නිහඬකිරීමට දැරෙන ප්‍රයත්නයකි.

හඳුනානොගත් සමහරුන් විසින් පසුගිය වසර තුල මානව හිමිකම් ක්‍රියාධරයන්ට දුරකථනයෙන් කථාකොට ආණ්ඩුව හෙලානොදකින මෙන් මරණ තර්ජන එල්ලකොට ඇත. මෙය රටතුල පවතින භීෂණකාරී වාතාවරණය තවදුරටත් උත්සන්න කිරීමකි.

ආධාර ආයතන පිලිබඳව විමර්ෂණය කරන පාර්ලිමේන්තු කමිටුවක් 2005 දෙසැම්බරයේදී තම පරීක්ෂණවල වපසරිය මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ සාමය ගොඩනැඟීම යන අංශවලටද ව්‍යාප්ත කළේය. පසුගිය වසර 10 ඇතුලත කරන ලද ප්‍රකාශණ, සංවිධානය කළ වැඩමුලු සහ එයට සහභාගිවූවන් ඇතුලු විස්තර සහිතව වාර්තාවක් ලබාදෙන ලෙස කමිටුව රාජ්‍ය නොවන සංවිධානවලට නියෝග කළේය.

මාධ්‍ය නිදහසටද බරපතල තර්ජන එල්ලවී ඇත. 2005 අගෝස්තුවේ සිට ගැටුමට සම්බන්ධ විවිධ පාර්ශව විසින් මාධ්‍ය සේවකයන් එකොලොස්දෙනෙකු මරාදමා ඇත. මේ වනතුරුම, මේ ඝාතන සම්බන්ධයෙන් කිසිවෙකුත් දඬුවම් ලබා නැත.

එල්ටීටීඊයෙන් සහ ආණ්ඩුවේ හමුදාවලින් එල්ලවන ප්‍රබල තර්ජන හමුවේ තම ජීවිකාව කරගෙන යාමට දෙමළ ජාතික මාධ්‍යවේදීන්ට සිදුවී තිබේ. මාධ්‍යවේදීන් පැහැරගැනීම සහ ඝාතනය කිරීම සම්බන්ධයෙන් එල්ටීටීයට චෝදනා එල්ලවී තිබේ. දෙමළ මාධ්‍යවේදීන්ට ආණ්ඩුවේ ජනමාධ්‍යවල සේවය නොකරන මෙන් එල්ටීටීඊය තර්ජන එල්ලකොට තිබේ. ඇතැම් දෙමළ පුවත්පත් උතුරු නැගෙනහිර ප්‍රදේශවල බෙදාහැරීමට එරෙහිව නිලනොවන තහනමක් පණවා තිබේ. 2006 ඔක්තෝබරයේදී සහ 2007 ජනවාරියේදී තිනක්කුරල්, සුදරොලි සහ වීරකේසරී පුවත්පත් මඩකලපුවේ සහ අම්පාරේ බෙදාහැරීම කරුණා කණ්ඩායම විසින් තහනම් කොට තිබිණ.

සිංහල ජනමාධ්‍යවලටද ආණ්ඩුවේ පීඩනයෙන් ගැලවීමක් නොමැත. 2006 නොවැම්බර් 22 වෙනිදා "එල්ටීටීඊයට සහ මරාගෙන මැරෙන බෝම්බකාරියක සේ සැකකරන්නියකට ආධාරකිරීමේ" චෝදනාව යටතේ පොලිසියේ ත්‍රස්ත විමර්ශණ ඒකකය මවුබිම සිංහල පුවත්පතේ මාධ්‍යවේදිනී  මුනුසාමි පරමේශ්වරී අත් අඩංගුවට ගත්තේය. මානව හිමිකම් උල්ලංඝණයන්ට එරෙහිව ඇය විසින් කරන ලද හෙලිදරවු කිරීම් නිසා පරමේශ්වරී විශේෂයෙන් ඉලක්ක කරන ලදැයි සැලකේ. ඇය දිගටම රඳවාගැනීම සඳහා සාක්ෂි නොමැති බව අධිකරණය විසින් තීන්දු කරන ලදුව 2007 මාර්තු 22 වැනිදා ඇය නිදහස් කරන ලදි.

2007 පෙබරවාරි 27 වැනිදා ත්‍රස්ත විමර්ශණ ඒකකය මගින් මවුබිම ප්‍රකාශයට පත්කරන Standard Newspapers Ltd. සමාගමේ මූල්‍ය කළමණාකරු අත් අඩංගුවට ගන්නා ලදි. හදිසි නීති රෙගුලාසි යටතේ පොලිසිය ඔහු මාස දෙකකට අධික කාලයක් රඳවා තබාගත්තේය. 2007 මාර්තු 13 වැනිදා ආණ්ඩුව විසින් සමාගමේ ගිණුම් අත්හිටුවීම හේතුවෙන් මවුබිම සහ Sunday Standard පුවත්පත් වසාදැමීමට බලකෙරුනි. එල්ටීටීයට මූල්‍යාධාර සහ භාණ්ඩ සැපයීමේ චෝදනාව මත මැයි 30 වැනිදා පොලිසිය සමාගමේ අයිතිකරු අත් අඩංගුවට ගත්තේය.

පසුගිය වසර ඇතුලත ජනාධිපති රාජපක්ෂ ජනමාධ්‍යවල කතුවරුන් නිරන්තරයෙන් හමුවිය. එම සාකච්ඡාවලට සහභාගිවූවන් පවසන පරිදි, "දේශප්‍රේමී නොවීම" පිලිබඳව ඇතැම් අවස්ථාවල ඔහු කර්තෘවරුන්ට දොස් පවරා තිබේ. ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම්වරයා ඊටත් වඩා පියවරක් ඉදිරියට තබා තිබුනි. 2007 අප්‍රේල් මාසයේදී Daily Mirror පත්‍රයේ කර්තෘවරියට දුරකථනයෙන් ඇමතූ ඔහු, නැගෙනහිර පලාතේ මානව හිමිකම් ප්‍රශ්ණ පිලිබඳ ලියූ මාධ්‍යවේදිනිය "මරාදමන" බවට තර්ජනය කොට තිබුනි.

## <u>දඬුවම් නොකිරීමේ ප්‍රවණතාවය</u>

ආණ්ඩුවේ ආරක්ෂක හමුදා මගින් සිදුකරන මානව හිමිකම් උල්ලංඝනයන්ට දඩුවම් නොකිරීමේ කාලයක් මුලුල්ලේ ශ්‍රී ලංකාවේ දක්නට ලැබුනු ප්‍රවණතාවය තවදුරටත් එලෙසම පවතී. යුධ ගැටුම් උත්සන්න වන අතරවාරයේ අහඹු අත් අඩංගුවට ගැනීම් සහ අතුරුදහන්වීම්වල සිට යුධ අපරාධ දක්වා වූ විවිධ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවලට චෝදනා එල්ලවෙද්දී, ජාත්‍යන්තර මානවීය සහ මානව හිමිකම් නීතීන් උල්ලංඝනයන් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට දඬුවම් කිරීමට ඇති අකමැත්ත ආණ්ඩුව පැහැදිලිව ප්‍රදර්ශණය කොට ඇත. මෙවැනි මහා පරිමාණ හා බරපතල උල්ලංඝනයන්ට එරෙහිව පියවර ගැනීම සඳහා ආණ්ඩුවේ වත්මන් ආයතන පද්ධතිය ප්‍රමාණවත් නොවන බව සනාථවී තිබේ.

මානව හිමිකම් කොමිසම ඇතුළු ආණ්ඩුවේ විවිධ කොමිසම්වලට සාමාජිකයන් නම්කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීමට අවස්ථාව සැලසෙන පරිදි 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම මේ තත්ත්වයට බලපා ඇති එක් ප්‍රධාන බාධකයකි. 17 වැනි සංශෝධනය නොසලකා හරිමින් පොලීසිය, රාජ්‍ය සේවය සහ මානව හිමිකම් පිලිබඳ ආයතනවලට ජනාධිපතිවරයා විසින් කොමසාරිස්වරුන් පත්කොට ඇති අතර, ඒ' මගින් එම ආයතනවල ස්වාධීනත්වය පිලිබඳ සැකසංකා මතුකොට තිබේ. මේ අයුරින්ම නීතිපති පදවියේ ස්වාධීනත්වයද  අනතුරට ලක්කරමින් 17 වැනි සංශෝධනය නොසලකා ඒ'කපාර්ශ්විකව නීතිපතිවරයා පත්කොට තිබේ.

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳව දේශීය සහ විදේශීය වශයෙන් පලවන අවධානය උත්සන්නවීමට ප්‍රතිචාරයක් වශයෙන් සහ ජාත්‍යන්තර මානව හිමිකම් නිරීක්ෂණ කොමිසමක් පත්කිරීමේ යොජනා ඉදිරිපත්වීම වැලැක්වීමේ පූර්ව ක්‍රියාමාර්ගයක් වශයෙන්, 2005 අගෝස්තු මාසයේ පටන් සෑම පාර්ශවයක්ම අතින් සිදුවූ බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳව පරීක්ෂාකිරීම සඳහා ආණ්ඩුව විසින් 2006 නොවම්බර් මාසයේදී ජනාධිපති පරීක්ෂණ කොමිසමක් (CoI) පත්කරන ලදි. ජනාධිපති මහින්ද රාජපක්ෂ එකගවූ පරිදි සහ බොහෝ මානව හිමිකම් සංවිධාන ඉල්ලා සිටි පරිදි ජාත්‍යන්තර කොමිසමක් පත්කරනු වෙනුවට කොමිසම ශ්‍රී ලාංකික සාමාජිකයන්ගෙන් සමන්විත වූ අතර, ඔවුන්ට සහාය දීම සඳහා ස්වාධීන ජාත්‍යන්තර විශේෂඥයන්ගෙ මණ්ඩලය (IIGEP) නමින් ජාත්‍යන්තර නිරීක්ෂණ කමිටුවක් පත්කරන ලදි.

ජනාධිපති කොමිසම බරපතල ඌණතාවලින් යුක්තය: වැරදිකරුවන්ට දඬුවම් කිරීමේ ආණ්ඩුවේ ආයතන මගින් අපොහොසත්වූ ක්‍රියාදාමයක් කාර්යක්ෂමව ක්‍රියාවට නැගීමට කොමිසම සමත්වෙනු ඇතිදැයි තවමත් ස්ථිරව කිවනොහැක. පලමුවැන්න, සියලුම පාර්ශවයන් තවදුරටත් අපරාධවල නිරතව සිටින අතරවාරයේ, පරීක්ෂාකිරීම සඳහා බලය පවරන ලද බරපතල සිද්ධීන් 16 සම්බන්ධයෙන් කොමිසම විසින් පවත්වන පරීක්ෂණවල ප්‍රබල ප්‍රගතියක් ලබා ඇති බවක් නොපෙනේ. දෙවැන්න, කොමිසමට බලය ඇත්තේ ගතයුතු පියවර පිලිබඳව ආණ්ඩුවට නිර්දේශකිරීමට පමණක් බැවින්, කොමිසමේ පරීක්ෂණවල ප්‍රතිපලයක් වශයෙන් වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමට මගපෑදෙනු අතැයි සහතිකයක් නොමැත. තුන්වැන්න, ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් කරන ලද මානව හිමිකම් කඩවීම් පිලිබඳව සාක්ෂිදීම සඳහා සැබවින්ම බියපත්ව සිටින උල්ලංඝනයන්ට ගොදුරුවූවන් සහ වෙනත් සාක්ෂිකරුවන් උනන්දුකිරීමට ඉඩප්‍රස්ථාව සැලසෙන ආකාරයේ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ ප්‍රමාණවත් වැඩසටහනක් නොමැතිවීම පරීක්ෂණවල ප්‍රගතියට ප්‍රබල බාධාවකි. සිවුවැන්න, නීතිපති දෙපාර්තමේන්තුව කොමිසමේ පරීක්ෂණවලට කෙලින්ම සම්බන්ධවී සිටී. මෙය, කොමිසමේ පරීක්ෂණවල ස්වාධීනත්වය පිලිබඳව සැකසංකා මතුවීමට ඉඩතිබෙන, නීතිපතිවරයාගේ වගකීම්වල එකිනෙකට පරස්පර තත්ත්වයක් මතුකරන්නකි. අවසාන වශයෙන්, කොමිසමේ සභාපතිවරයා විසින් ජාත්‍යන්තර විශේෂඥයන්ගෙ කාර්යභාරය නිරීක්ෂණයට පමණක් සීමාකිරීම හේතුවෙන් සාක්ෂිකරුවන්ට කථාකිරීම ඇතුළු ස්වාධීන පරීක්ෂණ පැවැත්වීමේ අවස්ථාව ඔවුන්ට අහිමිකොට තිබේ.

(IIGEP) විද්වත් මඬුල්ල ජනාධිපතිවරයාට තම පළමු අතුරු වාර්තාව ඉදිරිපත්කරමින් කොමිසමේ පරීක්ෂණවල ප්‍රගතියක් ලැබීම දුෂ්කර බවට අනතුරු අඟවා තිබුනි. "කොමිසමේ ස්වාධීනත්වය, ඉලක්ක සපුරාගැනීම සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීම" වැනි තීරණාත්මක කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුව ප්‍රමාණවත් පියවර නොගැනීම පිලිබඳව එම වාර්තාවේ ප්‍රබල අවධානය පළකොට තිබුනි. (IIGEP) මණ්ඩලයේ දෙවැනි වාර්තාව මගින් නීතිපතිවරයාගේ කාර්යාලය කොමිසමේ කටයුතුවලට සම්බන්ධවීම

පිලිබඳව ප්‍රශ්ණකොට තිබුණු අතර, එහිදී අපක්ෂපාතීත්වය සම්බන්ධයෙන් ප්‍රශ්ණ මතුවන අවස්ථා උදාහරණ වශයෙන් දක්වා තිබුනි. කොමිසමේ ක්‍රියාකාරිත්වය "ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මිණුම්දඬු සමඟ නොගැලපෙන" බව සඳහන් කළ එම වාර්තාව මේ තත්ත්වය වෙනස්කිරීම සඳහා පියවර නොගතහොත් "එම ප්‍රමිතීන් සහ මිණුම්දඬුවලට අනුකූලව පරීක්ෂණ සාර්ථකව නිමාකිරීමට කොමිසම අපොහොසත්වනු ඇති බවද" සඳහන් කළේය.

මේ සියලු ප්‍රශ්ණ මගින් ඉඟිකෙරෙන්නේ ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින දඬුවම් නොකිරීමේ වාතාවරණය වෙනස්කිරීම සඳහා ප්‍රබළ ප්‍රගතියක් සනිටුහන් කිරීමට ජනාධිපති කොමිෂන් සභාව සමත් නොවිය හැකි බවයි. දිනෙන් දින වර්ධනය වන මානව හිමිකම් අර්බුදය සම්බන්ධයෙන් රාජපක්ෂ ආණ්ඩුව කිසිදු තීරණාත්මක පියවරක් ගෙන නැති අතර, කොමිසමේ ස්වාධීනත්වය සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීම වැනි කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුව හෝ කොමිසම ගෙන ඇති පියවර කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ. ජනාධිපති කොමිසම පත්කිරීම, දේශීයව සහ ජාත්‍යන්තරව මතුවන විවේචන සමහන් කිරීමේ පියවරක් විනා වැරදිකරුවන්ට දඬුවම් කිරීමේ සහ අනාගත මානව හිමිකම් උල්ලංඝනයන් වැළැක්වීමේ අවංක පියවරක් ලෙස දක්නට නොලැබේ.

## <u>ජාත්‍යන්තර ප්‍රජාවේ කාර්යභාරය</u>

බොහෝ විදේශීය ආණ්ඩු විශේෂයෙන්ම ජනාධිපති කොමිසමට සහාය පලකළ අතර, කොමිසමේ ක්‍රියාකාරිත්වය අසාර්ථක බවට නිරන්තරයෙන් දක්නට ලැබෙන සාක්ෂි මගින් පෙන්නුම් කෙරෙන්නේ මානව හිමිකම් ආරක්ෂාකිරීම සම්බන්ධයෙන් එම ආණ්ඩු තම ප්‍රවේශය පිලිබඳව යලි සිතා බැලීමේ අවශ්‍යතාවයයි. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවට ආධාර දෙන රටවල් මානව හිමිකම් උල්ලංඝනයන් නතර කරන මෙන් සහ වැරදිකරුවන්ට දඬුවම් කරණ මෙන් ආණ්ඩුවට දැනුම්දෙමින් තම අවධානය පලකිරීම උත්සන්නකළයුතුය. මානව හිමිකම් ආරක්ෂාකරන බවටත්, වැරදිකරුවන්ට දඬුවම් කරන බවටත් ශ්‍රී ලංකා ආණ්ඩුව නිරන්තරයෙන් ශ්‍රී ලංකාවාසීන්ටත් ජාත්‍යන්තර ප්‍රජාවටත් ප්‍රතිඥා දී ඇති නමුත් එම පොරොන්දුව ඉටුකිරීමට ආණ්ඩුව අපොහොසත්වී තිබේ.

යුධවදින සමය තුල සාමාන්‍ය වැසියන්ගේ ආරක්ෂාව සහතිකකිරීම ඇතුලු ජාත්‍යන්තර නීතියට ගරුකිරීමේ අවශ්‍යතාවය සාම ක්‍රියාදාමයේ සම සභාපතිවරුන් (ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය, යුරෝපා සංගමය සහ නෝර්වේ) මෙන්ම අනෙක් රාජ්‍යයන්ද ආණ්ඩුවට සහ එල්ටීටීයට අවධාරණය කළ යුතුය. මූල්‍යාධාර ජාත්‍යන්තර ප්‍රජාවට මෙහිදී යොදාගත හැකි ප්‍රබල මෙවලමකි. මානව හිමිකම් සම්බන්ධ ආණ්ඩුවේ ක්‍රියාපිලිවෙතේ වර්ධනයක් අතිවන තුරු මුල්‍යාධාර සීමාකරන බව බ්‍රිතාන්‍යය සහ ජර්මනිය දැනටමත් නිවේදනය කොට තිබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ශක්තිමත් යෝජනා සම්මත කරමින් සහ ඒවාට සහාය දැක්වමින් ජාත්‍යන්තර නීතියට ගරුකිරීම සඳහා ආණ්ඩුවට සහ එල්ටීටීයට බලකිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රජාව පියවර ගතයුතුය. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සියලුම පාර්ශවයන් - ආණ්ඩුව, එල්ටීටීඊය සහ කරුණා කණ්ඩායම - මගින් සිදුකරන මානව හිමිකම් සහ යුධ නීති උල්ලංඝනයන් නිරීක්ෂණය කිරීම, පරීක්ෂණ පැවැත්වීම සහ වාර්තා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් නිරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට

ජාත්‍යන්තර ප්‍රජාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සහ ආණ්ඩුව සමග කටයුතු කිරීම ඉතාමත් වැදගත්වේ.

**<u>ක්‍රමවේදය</u>**

2007 පෙබරවාරි- මාර්තු මාසවලදී ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් පවත්වන ලද මූලික පර්යේෂණ මත මෙම වාර්තාව පදනම් වී ඇත. කොළඹ හා තදාසන්න ප්‍රදේශවලත්, මඩකලපුව සහ යාපනය දිස්ත්‍රික්කවලත් Human Rights Watch සංවිධානය සංචාරය කළේය. තොරතුරු ලබාදුන් තැනැත්තන්ගේ ආරක්ෂාව පිණිස, බොහෝවිට ඔවුන්ගේ ඉල්ලීම මත, බොහෝ අයගේ නම් ඉවත්කොට හෝ සංස්කරණය කොට ඇත.

විවිධ කරුනුවලට අදාල ප්‍රශ්ණ 33 කට පිලිතුරු ඉල්ලා ජුනි මස 18 වැනිදින Human Rights Watch සංවිධානය ජනාධිපති මහින්ද රාජපක්ෂට ලිපියක් යැවීය. ජුලි 12 වැනිදා ආණ්ඩුව එයට පිලිතුරු එවන ලදි. අදාල පිලිතුරු වාර්තාවට ඇතුලත් කොට තිබේ. කරුණා සංවිධානයේ පැහැරගැනීම්වලට රජයේ සම්බන්ධයක් ඇති බවට එල්ලවන චෝදනා පිලිබඳව ආණ්ඩුව ආරම්භකළ පරීක්ෂණයේ වර්තමාන තත්ත්වය, පැහැරගැනීම් සම්බන්ධ චෝදනා මත අත් අඩංගුවට ගෙන ඇති සංඛ්‍යාව සහ හදිසි නීතිය යටතේ කොපමණ පිරිසක් අත් අඩංගුවට ගත්තේද යන්න වැනි ප්‍රධාන කරුණු කිහිපයකට ආණ්ඩුව පිලිතුරු සපයා නොතිබුනි.

## II. නිර්දේශ

**<u>ශ්‍රී ලංකා ආණ්ඩුවට</u>**

- ආණ්ඩුවේ හමුදා සහ කරුණා කණ්ඩායමත් ඊපීඩීයත් ඇතුලු ආණ්ඩුවට පක්ෂපාතී සන්නද්ධ කණ්ඩායම් විසින් සිදුකරන අතුරුදහන්කරවීම් වහාම නැවැත්වීම සහ ඒවාට වගකිවයුත්තන්ට දඬුවම් පැමිණවීම.

- හදිසි නීතිය සහ වෙනත් එවැනි නීති යටතේ හමුදාව සහ පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන ඇති සියලුම පුද්ගලයන්ගේ නම් ප්‍රකාශයට පත්කොට, රඳවාගෙන සිටින අයට පවුලේ සාමාජිකයන් සහ නීතිවේදීන් හමුවීම සඳහා වහාම කටයුතු සම්පාදනය කිරීම.

- පැහැරගැනීම්, අතුරුදහන්වීම් සහ ඝාතන පිලිබඳ ජනාධිපති කොමිසමේ (තිලකරත්න කොමිසමේ) වාර්තා ප්‍රකාශයට පත්කිරීම.

- අතුරුදහන්වීම්වලින් ආරක්ෂාකිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අත්සන් තබා ක්‍රියාවට නැංවීම.

- රජයේ ආරක්ෂක හමුදා සහ ආණ්ඩුවට පක්ෂපාතී සන්නද්ධ කණ්ඩායම් විසින් සිදුකරන වධබන්ධන පැමිණවීම්, අත් අඩංගුවට ගැනීම් සහ රඳවාගැනීම් හා සාවද්‍ය මනුෂ්‍ය ඝාතන වහාම නැවැත්වීම.

- ආරක්ෂක හමුදාවල මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳව දැනසිට එහෙත් එයට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අපොහොසත්වීම හේතුවෙන් ඒවාට වගකිවයුතු අණදෙන නිළධාරීන් ඇතුලු ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ට එරෙහිව විනය පියවර ගැනීම හෝ අධිකරණයේ නඩු පැවරීම.

- කරුණා කණ්ඩායම මගින් සිදුකරන ලමුන් පැහැරගැනීම වහාම නවත්වා, දැනට පැහැරගෙන සිටින තරුණයන් සහ දරුවන් වහාම නිදහස්කොට ඔවුන්ගේ පවුල්වලට භාරදීම.

- අත් අඩංගුවට ගැනීම් සහ ජනමාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා අනෙක් සිවිල් සමාජ සංවිධානවල කටයුතුවලට අතපෙවීම සඳහා හදිසි නීතිය යොදාගැනීම නැවැත්වීම.

- අනාථයන් බලහත්කාරයෙන් යලි පදිංචිකරවීම නවත්වා ඔවුන්ට ස්වේච්ඡාවෙන්ම ආපසු ගම්බිම් බලා යාම සඳහා පහසුකම් සලසාදීම.

- එල්ටීටීඊ පාලන ප්‍රදේශවල සිටින ජනතාව ඇතුලු අනතුරට ලක්වී සිටින ජනතාවට සහන සැලසීම සඳහා මානුෂික ආධාර ආයතනවලට එම ප්‍රදේශවල සංචාරය කිරීමට අවස්ථාව ලබාදී ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

- ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශවයන් විසින් සිදුකරන මානව හිමිකම් සහ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමේ සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ ජාත්‍යන්තර මානව හිමිකම් නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමට ආධාර ලබාදෙන රටවල් සමඟ එක්ව කටයුතු කිරීම.

- ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිලිබඳ රෝම ප්‍රඥප්තිය ක්‍රියාවට නැගීම.

## දෙමළ විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ)

- දෙමළ දේශපාලන පක්ෂ සහ වෙනත් කණ්ඩායම්වල සාමාජිකයන් ඇතුලු සාමාන්‍ය වැසියන් ඝාතනය කිරීම වහාම නතරකිරීම. මානව හිමිකම් උල්ලංඝනය කරන ඕනෑම සාමාජිකයෙකුට එරෙහිව අදාල පරිදි විනය පියවර ගැනීම.

- සාමාන්‍ය වැසියන්ට එරෙහිව ඉවක් බවක් නොමැතිව එල්ලකෙරෙන සියලුම ප්‍රහාර නතරකිරීම, ගැටුම් පවතින ප්‍රදේශවලින් පලායන සාමාන්‍ය ජනතාව ඉන් වැලැක්වීමට කටයුතු නොකිරීම සහ තමන්ගේ පාලනය පවතින ප්‍රදේශවලට ආරක්ෂිතව ඇතුලුවීම සඳහා මානුෂික ආධාර ආයතනවලට පහසුකම් සැලසීම.

- එල්ටීටීඊයට එරෙහි බව විශ්වාසකෙරෙන පුද්ගලයන්ට එරෙහිව කෙරෙන බියවැද්දීම්, කප්පම් ගැනීම් සහ අනෙක් සියලුම ආකාරයේ තර්ජන ගර්ජන වහාම නැවැත්වීම.

- බලහත්කාරයෙන් පැහැරගෙනගොස් බඳවාගැනීම හෝ ස්වේච්ඡාවෙන් ඇතුලු සියලුම ආකාරවලින් සංවිධානයට ළමුන් බඳවාගැනීම සහ ළමුන් යුද්ධයට යොදාගැනීම වහාම නතරකිරීම. වැඩිහිටියන් බලහත්කාරයෙන් බඳවාගැනීමද නතරකිරීම.

- එල්ටීටීයේ සිටින සියලුම ළමුන් නිදහස් කොට වයස අවුරුදු 18 සම්පූර්ණවීමට පෙර බඳවාගන්නා ලද අයටද අවශ්‍යනම් සංවිධානයෙන් ඉවත්වයාම සඳහා ඉඩසැලසීම.

- සියලුම ළමා සොල්දාදුවන්ට සුරක්ෂිතව යලි තම පවුල් සමග එක්වීම සඳහා යුනිසෙෆ් සංවිධානය සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

- එල්ටීටීඊ අණදෙන නිළධාරීන් හෝ අනෙක් සාමාජිකයන් විසින් වයස අවුරුදු 18ට අඩු ළමුන් බඳවා නොගන්නා බවට සහතික කිරීම සඳහා සියලුම පියවර ගැනීම සහ එවැනි බඳවාගැනීම් කරන ලද පුද්ගලයන්ට එරෙහිව ගන්නා ලද විනය ක්‍රියාමාර්ග පිලිබඳ ලිඛිත සාක්ෂි (UNICEF හෝ OHCHR සංවිධානය හරහා ) ජාත්‍යන්තර ප්‍රජාවට ලබාදීම.

- එල්ටීටීඊ සාමාජිකයන්ගේ වයස සහ ළමුන්ගේ අනන්‍යතාවය පරීක්ෂාකිරීම සඳහා UNICEF, SLMM ඇතුලු ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානවීය ආධාර ආයතනවලට සියළුම එල්ටීටීඊ - යුධමය සහ වෙනත් - කඳවුරුවලට ඇතුලුවීමට ඉඩදීම.

<u>කරුණා කණ්ඩායමට (ටීඑම්වීපී පක්ෂය සහ එහි සන්නද්ධ අංශය)</u>

- සියළුම ආකාරයේ බලහත්කාරයෙන් කෙරෙන බඳවාගැනීම් නතරකිරීම.

- බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් හෝ ස්වේච්ඡාවෙන හෝ සංවිධානයට ළමුන් බඳවාගැනීම වහාම නැවැත්වීම.

- හමුදා මෙහෙයුම් සඳහා ළමුන් යොදාගැනීම නැවැත්වීම.

- කරුණා කණ්ඩායමට බලහත්කාරයෙන් බඳවාගන්නා ලද ළමුන් සහ අනෙක් සියලු දෙනා නිදහස් කොට ළමුන් යලි ආරක්ෂා සහිතව ඔවුන්ගේ පවුල්වලට භාරදීම සහතික කිරීම පිණිස UNICEF සංවිධානය සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

- කරුණා කණ්ඩායමේ නායකයන් සහ සාමාජිකයන් පුද්ගලයන් පැහැරගැනීම්වලට සම්බන්ධ නොවීම සහතික කිරීම සඳහා සියලු පියවර ගැනීම සහ කලින් පැහැරගත් පුද්ගලයන් වහාම නිදහස් කිරීම.

- කරුණා කණ්ඩායමට එරෙහි බව සැලකෙන පුද්ගලයන් බියවැද්දීම සහ අනෙක් සියලුම ආකාරයේ තර්ජන ගර්ජන හා ඔවුන්ගෙන් කප්පම් ගැනීම නැවැත්වීම.

- කරුණා කණ්ඩායමේ නායකයන් හා සාමාජිකයන් විසින් කඳවුරුවල සිටින අනාථයන් බියවැද්දීම සහ අතවර කිරීම නැවැත්වීම සඳහා සියලු පියවර ගැනීම.

- කරුණා කණ්ඩායමේ සාමාජිකයන්ගේ වයස සහ ළමුන්ගේ අනන්‍යතාවය පරීක්ෂාකිරීම සඳහා UNICEF, SLMM ඇතුලු ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානවීය ආධාර ආයතනවලට කරුණා කණ්ඩායමේ සියළුම - යුධමය සහ වෙනත් - කඳවුරුවලට ඇතුලුවීමට ඉඩදීම.

<u>ආධාර දෙන රටවල ආණ්ඩුවලට</u>

- ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශවයන් විසින් සිදුකරන මානව හිමිකම් සහ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමේ සිදුවීම් නිරීක්ෂණය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ ජාත්‍යන්තර මානව හිමිකම් නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ එක්ව කටයුතු කිරීම.

- ගැටුම් පවතින ප්‍රදේශවල යුධමුක්ත කලාප පිහිටුවීමට එකඟවනමෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට සහ එල්ටීටීඊයට බලකොට එම ප්‍රදේශවල අනාථයන් රැස්වන ස්ථානවල මානුෂික අධාර රැස්කොට තැබීම.

- ජනවර්ගය නොසලකා සියලුම අනාථයන්ට ආරක්ෂාව සලසන මෙන් සහ අවතැන්වූවන් බලහත්කාරයෙන් යලි පදිංචිකිරීම නතරකරන මෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවට බලපෑම් කිරීම.

- පුද්ගලයන් අතුරුදහන් කරවීමේ ක්‍රියාදාමය වහාම නතරකොට, ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සම්බන්ධ බවට චෝදනා එල්ලවී ඇති සිදුවීම් පිලිබඳව පුලුල් පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට දඬුවම් කිරීමට පියවර ගන්නා මෙන් ආණ්ඩුවට බලකිරීම.

- බරපතල මානව හිමිකම් උල්ලංඝණයන්ට වගකිවයුතු අණදෙණ නිලධාරීන් ඇතුලු ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ට උචිත පරිදි දඬුවම් කරන මෙන් හෝ විනය පියවර ගන්නා මෙන් ආණ්ඩුවට බලකිරීම.

- ආධාර සේවකයන්ට ආණ්ඩුව විසින් පණවා තිබෙන අනවශ්‍ය සීමා ඉවත්කිරීම ඇතුලු අනතුරට මුහුණදී සිටින ජනතාවට මානුශික ආධාර ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා වර්ධනය කරන මෙන් සියලුම පාර්ශවයන්ට බලපෑම් කිරීම.

- ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සහ කරුණා කණ්ඩායමත් ඊපීඩීපීයත් ඇතුලු ආණ්ඩුවට පක්ෂපාතී කණ්ඩායම් විසින් සිදුකරන සාවද්‍ය මනුෂ්‍ය ඝාතන සහ සියලුම ආකාරයේ වධදීම්, අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබාගැනීම් නවත්වන මෙන් ආණ්ඩුවට බලකිරීම.

- ජනමාධ්‍ය, සිවිල් සමාජ කොටස් සහ රාජ්‍ය නොවන සංවිධාන දඩයම් කිරීම සඳහා හදිසි නීතිය යොදාගැනීම නවත්වන මෙන් ආණ්ඩුවට බලකිරීම.

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීම සඳහා මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රබල යොජනාවක් සම්මත කරගැනීමට කටයුතුකිරීම.